# ඔබේ සම්බන්ධතාවය ගැන ඔබ සිත්තැවුලෙන් පසුවේද?

සමහර අවස්ථාවල අපගේ ආදරණීයයන් සමඟ අමනාපයක් හෝ කේන්තියක් ඇති විය හැකිය. සමහර හැඟීම් අපි ප්‍රකාශ කරන්නේ ඒ අකාරයටයි. නමුත් කේන්තියක් දැනීම තවත් කෙනෙකුට රිදවීමට හෝ පාලනය කිරීමට කිසිදු අවස්ථාවක හේතුවක් කර නොගත යුතුය.

## කිසියම් අවස්ථාවක ඔබ?

ඔබේ සහකරු ඔබ රැකියාවක නිරත වීමෙන් හෝ අධ්‍යයන කටයුතු වල නිරතවීමෙන් වලක්වා තිබේද?

පවුලේ සාමාජිකයන්ගෙන් ලැබෙන මුදල් අත්හිටුවා තිබේද?

ඔබේ සහකාරියට සහ/දරුවන්ට ශාරීරික පහර දීම් කර තිබේද?

ඔබේ බිරිඳ හෝ දරුවන් කෑගැසීමෙන් හෝ හඬ උස්කර කතා කිරීමෙන් බියට පත් කර තිබේද?

ඔබේ සහකරු කිරීමට අකමැති දෙයක් කිරීමට ඔවුනට බලපෑම් කර තිබේද?

ඔබ කියන දෙය කිරීමට ඔවුන් අකමැති නම් ඔවුන්ගේ වීසා අවලංගු කරන බව ඔබේ පවුලේ සාමාජිකයෙකුට පවසා තිබේද?

ඔබේ සහකාරිය විවේචනයට ලක් කිරීම හෝ ඔවුන් ගැන නරක හැඟීමක් ඇති වන ආකාරයට ඔවුන්ව පත් කර තිබේද?



අපගේ චර්යාවන් වෙනස්කර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම අපගේ සහකරු, ළමුන් සහ පවුලේ සාමාජිකයන් සමඟ ආදරණීය, ආරක්ෂිත සහ ගෞරව සම්පන්න සම්බන්ධතාවයක් ඇති කර ගැනීමේ වඩාත්ම වැදගත් පියවර විය හැකිය.

## උපකාර ලබා ගැනීම

**පුරුෂයින්ගේ යොමු කිරීමේ සේවාව**
උපදෙස් සහ නොමිලේ උපදේශනය ලබා දෙයි
1300 766 491

**මෙන්ස්ලයින් ඕස්ට්‍රේලියා (Mensline Australia)**
පවුල් සහ සම්බන්ධතා ගැටළුවලට මුහුණ පා සිටින පුරුෂයින්ට සහ පිරිමි ළමයින්හට උපකාර සලසයි.
1300 789 978

Interpreter

13 14 50 ඔස්සේ ජාතික භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන සේවාව අමතා **ඔබ වෙනුවෙන්** උපකාරක සේවා හා සම්බන්ධ වෙන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න.

Whittlesea Community Connections
Making a positive difference everyday

VICTORIA State Government

විට්ල්සී කමියුනිටි කනෙක්ෂන්ස් (Whittlesea Community Connections) වික්ටෝරියානු රජයෙන් ලැබෙන අනුග්‍රහය අගය කරන බව ප්‍රකාශයට පත්කර සිටිමු .